# විවාහයට පෙර ප්‍රේම සබඳතා දෙකක් මට තිබුණා
## හෙළයේ මහා ගාන්ධර්වයාගේ අප්‍රකට තොරතුරු
## පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව

ලක් දෙරණෙහි වෙසෙන සෑම මිනිසකුගේ හද තුළ යම් සංගීත රිද්මයක් ඇත්නම්, ඒ සියල්ල එක්තැන් කර සංගීත ආරක් බිහිකිරීමට හැකි වූ අද්විතීය මිනිසෙක් වෙයි.

හෙතෙම, හෙළයේ අග්‍රගන්‍ය මහා ගාන්ධර්වයාණන් වන ආචාර්ය පණ්ඩිත් අමරදේවයන්ය. අමරදේවයන් තරම් වටිනා මිනිසුන් ඉදහිට මේ ලක්දිව බිහි වී තිබෙන්නට පුළුවන. එහෙත් ඔහුට වඩා වටිනා මිනිසකු මෙහි බිහිවූයේද යන්න පිළිබඳ තරමක් සිතා බැලිය යුත්තකි.

මා පටිගත කිරීමේ යන්ත්‍රයත් රැගෙන මේ සුවිශේෂී වූ පුද්ගලයා හමුවීමට ගියේ තරමක් වෙනස් ආකාරයේ කතා බහක යෙදෙන්නටය. හිමිදිරි පාන්දරම මා හට පැමිණෙන ලෙස දැන් වූ පරිදි එහි යනවිට මාගේ පැමිණීම බලාපොරොත්තුව එතුමා අසපුව තුළදීම මා පිළිගත්තේ මේ අයුරිනි.

ඉළන්දාරියාට මම පොඩි දඬුවමක් දුන්නේ?

**● ඇයි සර්?**

දැන් ඉන්න ඉළන්දාරි උදේ පාන්දර අවදි වෙන්න, පරිසරයේ සුන්දරත්වය විඳින්න පිරිසිදු වාතාශ්‍රය ලබන්න පුරුදුවෙලා නැහැ.

● ඔබතුමා කීයටද අවදි වුණේ

උදෑසන අවදිවීම කයටත්, මනසටත් එක වගේ හිත කරයි. මම හිරුට කලින් පිබිදුනේ.

**● උදෙන්ම පිබිදී ඔබතුමන් මොනවද කරන්නේ?**

කායික මානසික ව්‍යායාම.

**● ව්‍යායාම හැටියට ඔබතුමා මොනවද කරන්නේ?**

නාවින්න ආයුර්වේදය ළඟට ඇවිද ගෙන යනවා. ආපසු එනවා.

**● ඒ ඇවිත් ?**

විවේක අරගෙන නාලා පිරිසිදු වෙනවා. වයලීනය වාදනය කරනවා.

**● කොච්චර වෙලා වාදනය කරනවාද?**

ඒක මට ඇති කියලා හිතෙන තුරු.

**● මේ පුරුදු වලින් ලබන ප්‍රතිඵලය?**

ශාරීරික සුවය, කායික මානසික සමතුලිතතාවය. ඒක රැකගැනීම හරිම වැදගත්.

**● ඔබතුමා බොහොම ප්‍රබෝධයෙන් සැහැල්ලුවෙන් ඉන්න බව පේනවා?**

කායික මානසික සංහිඳියාව තුළ ඇත්තේ සැහැල්ලුව තමයි.

**● දැන් ඔබතුමාගේ වයස කීයක් විතර වෙනවද?**

අවුරුදු 77 ක්

**● ශරීර සෞඛ්‍යය ගැන අවධානයෙන්ද ඉන්නේ**

ඔව්. මගේ බිරිඳ ''විමලා'' ඈ මගේ දෙවැනි මව් හැටියට මාව රැකබලා ගන්නවා. මගේ දරුවනුත් එහෙමයි.

**● අතීත මතකයන් කොහොමද? අධ්‍යාපනය ලැබූ අවධිය එහෙම?**

විචිත්‍රවත් අධ්‍යාපනයක් තමයි මම ලැබුවේ. සංගීතය විතරක් නෙවේ තාරකා විද්‍යාව, ගණිතය වගේ විෂයන් හදාරන්නත් ඒ කාලේ මගේ ලොකු උනන්දුවක් තිබුණා. ගායනය වාදනය තරඟ වලින් හැමවිටම මම ප්‍රථම ස්ථානය ලැබුවා.

**● ඔබතුමාගේ තරුණ අවධිය**

සංගීතය හදාරන්න ඉන්දියාවට ගියා. ඒ 1953 අවුරුද්දේ.

**● ඒ කාලයේදී ඔබේ සුවිශේෂී වූ ප්‍රතිභාව දකින කොට තරුණ හිත්වල ඔබතුමා ගැන ආදරයක් එහෙම ඇතිවෙන්න ඇති?**

ඔව්. ඔව්. මට ආදරය කරන වනිතාවෝ කොච්චර නම් ඉන්නවද අදටත්. ඒ හැමෝම මගේ ප්‍රතිභාවට ඇලුම් කරන අය.

**● එහෙම නෙවෙයි මම අහන්නෙ. ඔබතුමන්ට ඒ කාලේ පම්වතියක් හිටියාද?**

එහෙම සබඳතා නම් මෙහෙදි තිබුණේ නැහැ. මම ඉන්දියාවෙ හිටිය කාලෙදි නම් එවැනි සබඳතා තිබුණා. ඒවා යෞවනයට අරුමයක් නොවෙයිනේ.




**● මාගේ දේශය අවදි කරනු මැන පියාණෙනි.... පියාණෙනී කීවේ කාටද?**

අපි හිතමු දේශය පාලනය කරන ඇත්තන්ට. ඥානයයි නිවහල් වෙන්න ඕනෑ. එතැනයි ස්වර්ග රාජ්‍යය බිහිවෙන්නෙ

**● ඔබතුමාට ප්‍රේම සබඳතාවයක් තිබුණා?**

දෙකක්ම තිබුණා.

**● ඒ අයගෙ නම් ගම් එහෙම මතකද?**

එක්කෙනෙක් තමාරා. ඇය රුසියන් යුවතියක්. ඒ කාලෙ ඈ මට පුදුම විදියට ආදරය කළා. අනෙක් කෙනා ඉන්දියානු යුවතියක්. ශීලා චක්‍රවර්තී. ඇය මගෙන් අධ්‍යාපනයත් ලැබුවා. ඒ කාලේ අප අතරේ භාවාතීශය සම්බන්ධයක් ගොඩ නැගුනා.

**● ඒ සබඳතා විවාහය දක්වා ගෙන ආවේ නැත්තේ ඇයි?**

මම නවසිය පනස් නවයේ ආපසු ලංකාවට ආවා. විවාහය තරමටම ඒවා දුර දිග ගියේ නැහැ. ඒ නිසා ඒවා අමතක කරන්න සිදුවුණා. ඒවා යෞවනයට සම්බන්ධ සාමාන්‍ය දේවල්. එතරම් අරුමයකුත් නැහැ.

**● දැන් ඒ අය කතා කරනවාද?**

ඔව්. ඔව්. අපි අතර විරසක වීම් නැහැ. ශීලාගේ සහෝදරයා කුමාර් චක්‍රවර්ති. ඔහු කල්කටාවේ බැංකු සමාගමක අධ්‍යක්ෂවරයෙක්. මට නිතර ඇරයුම් කරනවා එහේ නිවාඩුවක් ගත කරන්න එන්න කියලා.

**● ඔබතුමන්ගේ 'බිරිඳ' 'විමලා' හමුවුණේ කොහොමද?**

ගුවන් විදුලියේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල් එම්.ජේ. පෙරේරා මහතා මට භාර දුන්නා දේශීය සංගීත ආරක් ගොඩනැගීමේ අරමුණින් අලුත් ගීත සංග්‍රහයක් පටන් ගන්න කියලා. ඉතින් මේවා හොයාගෙන යනකොට අපේ පැරණි පතල් කවි, පාරු කවි, නෙළුම් කවි සාම්ප්‍රදායික අයුරින්ම මධුර ලෙස ගයන යුවතියක් හැටියට මට විමලා හමු වුණා. සාම්ප්‍රදායිකත්වය මත ගොඩනැගුණ මධුර ගායනයට මම ඇලුම් කළා. මගේ ප්‍රතිභාවට ඇයත් ඇලුම් කළා. මේ විධියටයි ප්‍රේම සම්බන්ධය ගොඩ නැගුනේ.

**● දෙමාපියන්ගෙන් විරෝධයක් මතු වුණේ නැහැ.**

නැහැ. දෙපාර්ශවයේම ආශීර්වාදය ලැබුණා.

**● මෙතෙක් ආ ගමනේ බාධක හිරිහැර එහෙමත් තියෙන්න ඇතිනේ?**

දැන් දැන් තමයි කලාව තුළ කෙනෙකුගෙ ගමනට බාධා හිරිහැර වගේ පීඩාකාරී තත්ත්වයන් ඇති වෙන්නේ. නමුත් එදා එවැනි දේ හරිම අඩුයි. තමන්ගේ ගුරුවරයාටත් වඩා දක්ෂතා පෙන්වන ශිෂ්‍යයන් නිහතමානීව ඉහළ තලවලට ඒ ගුරුවරු අරන් ගියා. මොහොමඩ් ගවුස් මාස්ටර් බොහෝ අවස්ථාවල ඔහුටත් වඩා ඉදිරියෙන් මා තැබුවා. ඒ තරමට උතුම් මුදිතා ගුණයෙන් ඒ අය ක්‍රියා කළා. අද ඒ මිනිස් සාරධර්ම පද්ධතිය බිඳ වැටිලා.

**● ඔබගේ ජ්‍යෙෂ්ඨතම ගෝලයන් කවුද?**

නන්දා මාලනී, නාරද දිසාසේකර, අමිතා වැදිසිංහ වගේ අය ඉන්නවා.

**● ඔවුන් ඒ බව කියනවද?**

ඕනෑ තරම් කියනවා.

**● ජ්‍යොතිෂය හඳහන වගේ දේවල් ඔබතුමා විශ්වාස කරනවාද?**

එවැනි ගුප්ත දේවල් කෙරෙහි විශ්වාසය තබාගෙන ඇති ඵලයක් නැහැ. මිනිසුන් තුළ ශ්‍රද්ධාව ඇති වුණේ සොබා දහමේ තිබූ අපූරු චමත්කාරයට. ඒ නිසා මුල් යුගයේ මිනිසුන් ගස් ගල් කඳු ශිඛරවලට වන්දනා මාන කළා. පසුකාලීනව මේ ශ්‍රද්ධාවට ප්‍රඥාවත් එකතු වුණා. ශ්‍රද්ධාවේත් ප්‍රඥාවේත් සංකලනයෙන් තමයි මනුෂ්‍යත්වය ඇති වෙන්නෙ. ශ්‍රද්ධාව බුද්ධිය ඇති මිනිසුන් ඔය වැනි විශ්වාස කෙරෙහි ලොබ බඳින්නෙ නැහැ. ඔවැනි ගුප්ත විශ්වාස ලුහු බැඳීමෙන් සිදුවන්නේ ප්‍රඥාව අවප්‍රමාණවීමයි.

**● එහෙමනම් මොනවද විශ්වාස කරන්නෙ?**

සොබා දහම කෙරෙහි විශාල විශ්වාසයක් තියෙනවා. එය යථාර්ථවාදී විශ්වාසයක්. සුනාමි ව්‍යසනය නිසා අපේ රට වගේම ලෝකයේ බොහෝ රටවල මිනිසුන් අසරණකමේ අඩියටම වැටුණා. ඉතින් සොබා දහම මේ විශ්වාසය බින්දනෙ. නැහැ. ඒ සොබාදහමෙන් අපට ලැබුණ අණක්. පටු ආකල්පවලින් මිදිලා ඥාණාන්විතව සොබා දහම තුළ හැසිරෙන්න කියලා. සොබා දහමේ රීතීන් උල්ලංඝණය කිරීමට මිනිසාට නොහැකි බවට සොබාදහම අපට ඉඟි කළා.

**● පටු අදහස් නම් පවුරෙන් ලෝකය කැබලි වලට නොබෙදී...... ඥාණය නිවහල් වී.... ගීතයේ වගේද?**

ඒ විතරක්ද බියෙන් තොරව හිස කෙළින් තබාගෙන හිඳිනට හැකි කොහෙදෝ ඒ වූ නිදහසේ ස්වර්ග රාජ්‍යයට.....

**● මාගේ දේශය අවදි කරනු මැන පියාණෙනි.... පියාණෙනී කීවේ කාටද?**

අපි හිතමු දේශය පාලනය කරන ඇත්තන්ට. ඥානයයි නිවහල් වෙන්න ඕනෑ. එතැනයි ස්වර්ග රාජ්‍යය බිහිවෙන්නෙ.

**● ආගම දහමට ඔබතුමන් ළඟ ඇති නැඹුරුව කොහොමද?**

මම බෞද්ධ දර්ශනය අධ්‍යයනය කරනවා. ඉවතලන්න එහි දෙයක් නැහැ. මිනිසත් බව උතුම්ම තලයකට ගෙන යාම සඳහා අවශ්‍ය සියලු කරුණු ඒ දර්ශනය තුළ තියෙනවා. බුදු දහම කියන්නේ ශ්‍රද්ධාවේ සහා ප්‍රඥාවේ සුසංයෝගයක්.



**● විවේක වෙලාවට විනෝදය පිණිස මොනවද කරන්නෙ.**

අලස සුවයෙන් ඉන්න කැමතියි. මිතුරන් සමඟ සාද පවත්වනවා. ඉරිදා දිනවල මුහුදේ නාන්න යනවා.

**● 2004 දෙසැම්බර් 26 ඉරිදා දිනයක්. මතක ඇතිනෙ ඔබතුමාට?**

මට විතරක් නෙවේ ලෝකයේ කිසිම සත්ත්වයකුට අමතක නොවන දවසක්. සුනාමියෙන් ලෝක විනාශය සිද්ධ වුණ නිසා.

**● ඉතින් එදා ඉරිදා දිනයක් නිසා මුහුදේ නාන්න යන්න ඇතිනෙ?**

අපි දෙසැම්බර් 23 ගියා කොත්මලේ මිතුරකුගේ ගෙදර. නිවාඩුවක් ගත කරන්න. ආපසු ආවේ 26 වෙනිදා. ගෙදර හිටියා නම් එදා උදේ අනිවාර්යයෙන්ම මුහුදේ නාන්න යනවම තමයි.

**● ඒකෙන් බේරුණ එක ගැන මොකද හිතෙන්නෙ?**

ස්වභාවිකවම සිදුවුණ දෙයක්

**● වසර 77 ක ජීවන ගමන දිහා ආපසු හැරී බැලුවොත් මොකද හිතෙන්නෙ?**

යම් යම් සොම්නස් දනවන හැඟීම් ඇති වෙනවා. අවම පහසුකම් යටතේ මේ තරම්න්වත් කළා. තව පහසුකම් තිබුණා නම් කොතරම් දේ කරන්න තිබුණාද?

**● මෙතෙක් කළ හොඳම නිර්මාණය මොකක්ද?**

තවමත් මගේ හොඳම නිර්මාණය බිහිවුණේ නැහැ. මා තුළ ඇති සැබෑ නිර්මාණකරුවා අනාගතයේදී එළි දකීවි.

**● මැග්සයිසේ සම්මානයත් සමඟ ඔබතුමාට විශාල මුදල් පරිත්‍යාගයකුත් ලැබුණා. මේ ගැන මොකද හිතෙන්නෙ.**

මා කළ යහපත් දේ වලට අදෘෂ්‍යමානව ලැබුණු ඵලයක් හැටියටයි මට හිතෙන්නෙ. එවැනි දෙයක් නොලැබුණා නම් ජීවිතයේ සැඳෑ භාගය යම් අසහනකාරී තත්ත්වයකින් ගෙවෙන්නත් තිබුණා.

සාකච්ඡා කළේ

**පණ්ඩුක සමරසේකර**